# මනුකට හමු වූ රාහුල පොඩි සාදූ



ආදර්ශ්නා ගජේන්ද්‍රා

# මනුකට හමු වූ
# රාහුල පොඩි සාදූ

ආදර්ශ්නා ගජේන්ද්‍රා

# මනුකට හමු වූ රාහුල පොඩි සාදූ

## ආදර්ශ්නා ගජේන්ද්‍රා

කතෘ

**කතෘගේ වෙනත් කෘති**

- ගුරුතුමීට තෑග්ගක් ISBN 978-624-592-2 (15. 11.2023)
- කවිමුතුවැල් ISBN 978-624-206-593-9 (15. 11.2023)
- අත්තම්මගේ දත වැටිලා ISBN - 978-624-208-095-6 (15. 11.2023)
- කරුණාවන්ත මායා ISBN - 978 -624-208-348-3 (02. 08. 2025)
- පුංචි මගේ කවි සිතුවිලි ISBN - 978-624-208-349-0 (02. 08. 2025)
- හතේ විත්ති හතක් (15. 11.2023)
- The little seed's big adventure ISBN - 978-624-206-715-5 (15. 11.2023)
- Caterpillar's Magical Journey ISBN - 978-624-206-716-2 (15. 11.2023)
- The Little Raindrop ISBN 978-624-206-717-9 (15. 11.2023)
- Everyone Special ISBN 978-624-206-718-6 (15. 11.2023)
- The life of a chocolate cake ISBN - 978-624-208-352-0 (02. 08. 2025)
- The Mysterious Door ISBN - 978-624-208-350-6 (02. 08. 2025)
- Lyra ISBN - 978-624-208-351-3 (02. 08. 2025)

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
**4 ශ්‍රේණිය B**
**2025. 02. 08**

**ISBN - 978-624-208-347-6**

# මනුකට හමු වූ
# රාහුල පොඩි සාදූ

මෙම පොත මාගේ ආදරණීය දෙමාපියන්ට සහ මාගේ
පවුලේ සැමට පුදකරමි.

ආදර්ශ්නා ගජේන්ද්‍රා

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එදා සෙනසුරාදා දිනයක් නිසා උදේ වරුවම මනුක කළේ මල්ලිත් සමඟ සෙල්ලම් කරන එක. මහන්සි නිසා දහවල් කෑමෙන් පසු මනුක ටිකක් විවේකීව සිටියා.

සෑම සෙනසුරාදා දිනයකදී ම සවස මල්ලී සමඟ පන්සල් යෑම මනුකගේ පුරුද්දක්.

"අද හවස පන්සල් යන්න ඕනෑ" .
මනුක හාන්සි පුටුවක වාඩිවී කල්පනා කළා.

වෙනදා වගේම සවස මනුක පන්සල් යන්න සූදානම් වුණා. මල්ලී  තරමක් අසනීපයෙන් සිටි නිසා මනුකට එදා පන්සලට යන්න වුණේ තනියම. අම්මා මැද දුන් සුදු කමිසයත් ලා දුඹුරු පාට කොට කලිසමත් ඇඳගත් මනුක තෙල්, මල්, තිර, සුවඳකූරු රැගෙන පයින්ම පන්සලට ගියා.




පන්සල පිහිටා තිබෙන්නේ ගම මැද තිබෙන කන්දක් උඩ. එතනට හරි ලස්සනට අවට පරිසරය පේනවා. ලස්සන කඳු වලල්ලත්, ඒ අතර පොඩි කඳු කිහිපයක් මුදුනේ ඇති පන්සල් වගේම, ලස්සන ලොකු වෙල් යායකුත් එතනට පෙනුණා. පෝය දවස්වල රෑට මෙතන ගොඩක් ලස්සනයි.

"අපේ ගම කොච්චර ලස්සනද?" මනුකට සිතුණා.


සෙරෙප්පු දෙකත්, තොප්පියත් ගලවා පන්සල් භූමියට ඇතුළු වූ මනුක ගෙනා බඩු සියල්ල පසෙකින් තැබුවා. ඔහු මුලින්ම කළේ බුදු මැදුරේ , චෛත්‍යය වහන්සේගේ සහ බෝධීන් වහන්සේගේ ආසනවල තිබූ පරවූ මල් ඉවත්කර පිරිසිදු කිරීමයි.ඊළඟට ඉදලක් ගත් මනුක එක රටාවකට පන්සල් මිදුල ඇමදුවා.හරියට පොල් අත්තක් වගේ. එහෙම ලස්සනට මළුව අමදින්න මනුකට කියලා දුන්නේ එයාගෙ අත්තම්මා.

අත්තම්මා දැන් දිව්‍යලෝකෙ ගිහින්. එයාට අත්තම්මා මතක්වුණා. රාහුල පොඩි සාදු හැමදාම පන්සල් මළුව අමදින විට වැලි අහුරක් අහසට වීසිකොට
" අද මට මේ වැලි කැට ගණනට අවවාද ලැබේවා!"
කියා ප්‍රාර්ථනා කළා කියලා අත්තම්මා එයාට කියා දී තිබුණා. ඒ වගේම පාසලේ බුද්ධ ධර්මය පොතේ පාඩමකත් රාහුල පොඩි සාදුගේ එම ගුණය ගැන ලියලා තිබුණා .



ඊ ළඟට මනුක අත් සෝදාගෙන පිළෙවෙලට මල් වට්ටි වලට ඇහිරුවා. මුලින්ම චෛත්‍ය වහන්සේටත්, දෙවනුව බෝධීන් වහන්සේටත්, තුන්වනුව පිළිම වහන්සේටත් ඒවා පූජා කොට වන්දනා කළා. දුක් මහන්සියෙන් මනුකත් මල්ලීත් බලා ගන්නා අම්මාටත් අප්පච්චීටත් එයා පින් දුන්නා. මල්ලීට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කළා.ඉන් පසු වෙනදා වගේම මනුක ටික වෙලාවක් මෛත්‍රී භාවනාව කළා.

භාවනා කරන අතරතුර කවුරුහරි තමන්ගේ ළඟට ආව බව මනුකට දැනුණා. මනුක භාවනාව නවතා ඇස් ඇර බැලුවා. එවිට දකින්නට ලැබුණු දෙයින් මනුකට ඇස් අදහාගත නොහැකිවුණා.
"රාහුල පොඩි සාදු!"
මනුක පුදුමයෙන් කිව්වා.රාහුල පොඩි සාදු මනුකගෙ බුද්ධ ධර්මය පොතේ ඇඳලා තිබුණ පින්තූරෙ වගේමයි. එයා රාහුල පොඩි සාදුට වැන්දා."සුවපත් වේවා!



මනුක අද තනියම පන්සල් ආවාද?"
"එහෙමයි පොඩි සාදු ,මල්ලිට අසනීප නිසා
මම තනියම ආවා".
"එහෙනම් සෙල්ලම් කරන්නත් කෙනෙක්
නැතුව ඇති නේද?""ඔව්, ඒත් මල්ලිට හොඳවෙයි
ඉක්මනින්ම".
"ඔබ වහන්සේ කොහොමද අපේ පන්සලට වැඩියේ?"
"මට මනුකත් එක්ක ටිකක් කතා කරන්න ආසා හිතුනා.
මනුක, ඔයා හොඳ ළමයෙක්. නිතරම පින් දහම් කරනවා.
වඩිහිටියන්ගේ අවවාද පිළිගන්නවා. ලොකු
වෙනකොටත් මේ වගේම හොඳින් ඉන්න ඕනෑ
"උන් වහන්සේ මනුකට කිව්වා. මනුක හොඳ
ළමයෙක් වෙන බවට රාහුල පොඩි හාමුදුරුවන්ට
පොරොන්දු වුණා.

"රාහුල පොඩි සාදු , ඇයි ඔබ වහන්සේ පැවිදි වුණේ?"
"ඇයි මනුකට මතක නැද්ද? මගේ අප්පච්චී, ඒ කියන්නේ තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ තමයි මා පැවිදි කළේ"." අනේ , මට ඒ කතාව කියන්නකෝ".
"මනුක, මගේ අප්පච්චි මා ඉපදුණු දවසේම මමත්, මගේ අම්මා වන යශෝධරා දේවියත් හැර ගොස් පැවිදි වුණා.එදා මගේ අම්මා ගොඩාක් ඇඬුවාලු.
මම ගොඩක් පොඩි නිසා මට ඒක දැනුණේ නෑ. ඒත් මම ටික ටික ලොකු වෙනකොට  මම අම්මා දුක් වෙන හැටි දැක්කා. සමහර දවස්වලට අම්මා ගොඩාක් ඇඬුවා. අප්පච්චී දුෂ්කර ක්‍රියා කරන බව අසා, අම්මාත් දුෂ්කර ක්‍රියා කළා. කහපාට ඇඳුම් ඇන්දා.  ඒවා දකිනකොට මට අම්මා ගැන ගොඩක් දුක හිතුණා. මම අම්මාට ආදරෙයි.



මට අම්මා අප්පච්චි ගැන විස්තර කියලා
දුන්නා. එයා ඉතාම ශ්‍රේෂ්ඨ උතුමෙක් බව අම්මා කිව්වා.
මනුක නරසීහ ගාථා අහලා තියනවද? ඒකෙන්
කියන්නෙ මගේ අප්පච්චි ගැන. අම්මා කියූ කතා
අසා මම අප්පච්චීටත් ගොඩක් ආදරය කළා.



ඉතින් මම අප්පච්චි දකින්න ආසාවෙන් ඉන්නකොට, උන් වහන්සේ එක දවසක් කිඹුල්වත් නුවරට වැඩියා. අපේ අම්මාත්, මාත් බලන්න උන් වහන්සේ රජ මාලිගාවට වැඩියා. ඉතින් එදා ගොඩාක් සතුටු හිතෙන්න ඇති නේද? ඔව් මනුක, මට එදා ගොඩාක් සතුටුයි. අම්මාටත් සතුටුයි. මම උන්වහන්සේගේ සිවුරේ එල්ලිලා හිටියා. මට අප්පච්චී කරුණාවෙන් කතා කළා. ඉන් පෙර කවදාවත් අප්පච්චි දක තිබුණේ නැති නිසා මට උන් වහන්සේ ළඟ ඉන්නත්, කතා කරන්නත් ආසා හිතුණා. යශෝධරා දේවිය ඒ කියන්නේ මගේ අම්මා මට කිව්වා උන් වහන්සේගෙන් දායාද ඉල්ලාගන්න කියලා. මම දායාද ඉල්ලුවා.

ඊට පස්සේ
උන් වහන්සේ මාව පන්සලට එකතුකරගෙන ගිහින් පැවිදි කළා. ඒකටනම් මගේ සීයා, සුද්දෝධන මහරජතුමාට තරහා ගියා. අප්පච්චී පැවිදි වුණාට පස්සේ මාව බලාගත්තේ සීයානෙ".




"ඉතින් ඒ ගැන ඔබ වහන්සේ බුදුරජාණන් වහන්සේට කිව්වෙ නැද්ද?"

"කිව්වා, උන්වහන්සේ කරුණාවෙන් මට හැම දෙයක්ම පැහැදිලි කරලා දුන්නා. උන් වහන්සේ පැවිදි වී බුදු බව ලැබුවේ සියලු සත්වයන්ගේ යහපත වෙනුවෙන් කියා කිව්වා. මටත් උන්වහන්සේ වගේම වෙන්නයි ඕනැවුණේ. පස්සෙ මගේ අම්මත් පැවිදි වුණා".

"ඉතින් අම්මා දාලා එනකොට දුක හිතුණේ නැද්ද?""

පන්සලට එනකොට දුක හිතුණේ නෑ. මුල්ම දවසේ මම හිටියෙ සතුටින්. මම කවදාවත් අප්පච්චි ළඟ නිදාගෙන තිබුණේ නෑ. ඒ නිසා මම එදා නිදාගත්තේ අප්පච්චි ළඟ. ටික දවසක් යනකොට, මට අම්මා මතක් වෙලා දුක හිතුණා. අම්මාට අප්පච්චිත් නෑ ;මමත් නෑ".



“ඔබ වහන්සේ වැඩිහිටියන්ගේ
අවවාද පිළිගන්න හරිම කැමතියි කියලා
මම අහලා තියනවා". "ඔව් මනුක ,
මම ඉස්සර මළුව අමදිනවිට වැලි
මිටක් උඩ දාලා ඒ
වැලි ගණනට මට
අවවාද ලැබේවා
කියලා ප්‍රාර්ථනය
කළා. ඒ වගේම
ඒවා පිළිපැද්දා".



"ඔබ වහන්සේට අනිත් අය කරදර කළේ නැද්ද?"

"මොකද නැත්තෙ?

දවසක් සාමණේරනමක් මා මළුව ඇමදූ ඉදල ගෙන ගොස් නැවත මළුවේ දමා, මම එය නියමිත තැන තබා නැති බව කීවා . මම එය නැවත හරි තැන තැබුවා. තව දවසක් මළුවට කොළ රොඩු ගෙනැවිත් දමා තිබුණා. මම ඒවා නැවතත් අතුගෑවා. ඒ හැමෝම මට හිනා වුණා".


"ඉතින් තරහා ගියාද?"

"නෑ මනුක. එකෙන් තමයි මම ඉවසන්න පුරුදු වුණේ".

රාහුල පොඩි සාදුගේ යහපත් ගතිගුණ ගැන මනුකට පුදුමයි.ඇත්තටම රාහුල පොඩි හාමුදුරුවන්ගෙන් අපිට අපේ ජීවිතයට  ඉගෙන ගන්න ගොඩක් දේවල් තියනවා. දන්නෙම නැතුව දෙදෙනාම බොහෝ වේලාවක් කතා කරලා.කලුවර වැටෙන්නත් ළඟයි. "රාහුල පොඩි සාදු, දැන් ටිකක් කලුවරවේගෙන එන නිසා මම ගෙදර ගියොත් හොඳයි. අම්මා මාව හොයනවා ඇති".
එසේ කියූ මනුක ගෙදර එන්න රාහුල හාමුදුරුවන්ට වැන්දා.

එතකොටම අම්මා, "පුතා ඉක්මනින් ඇඟ සෝදාගෙන පන්සල් යන්න ලෑස්තිවෙන්න" කියමින් මනුක සොලවනවා ඔහුට දැනුණා.

"පුටුවේම නින්ද ගියා නේද?"අම්මා ඇසුවා.තමන් දිග නින්දකට වැටී ලස්සන සිහිනයක් දැක ඇති බව මනුකට තේරුණේ එවිටයි.මනුකට ලැජ්ජා හිතුණා. මනුක මල්ලිත් සමඟ එදා පන්සල් ගියේ රාහුල පොඩි හාමුදුරුවන් ඇත්තටම මුණගැසුණා නම් කොච්චර හොඳදැ' යි සිතමින්.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්



978 624 208 347 6